# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2001/37 - 2017 ජනවාරි මස 11 වැනි බදාදා - 2017.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DS/GFG/L & L/02/2009/02.

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2009/VT/98.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල මහ නගර සහා සීමාව තුළ 97ඒ වැලිවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැලිවත්ත ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මු.පි.ගා අංක 4198 දරණ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0524 ක් වූ පහත නම්වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් සඳහා මායිම් -

කැබලි අංක. 01

ඉඩමේ නම: ඔරොප්පුවත්ත මාවත කැබැල්ල, වරිපනම් අංක 09, මාතර පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ ගරා වැටුණු ගොඩනැගිල්ලක කොටස් ඇත; හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0524.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2017.01.25 වැනි දින පෙ.ව. 09.00 ට ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛවිය යුතු ය.

තව ද, 2017.01.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩමට/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතව වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ඩබ්.එස්.සත්‍යානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත්සතර - ගාල්ල.


1A -G 24922 - 14 (2017/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.